ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

# **පුවත්පත් නිවේදනය**

## **යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ජනතා අයිතියට පත් කෙරේ**

ඉන්දියානු රජයේ ප්‍රදාන යටතේ ඉදි වූ සුවිශේෂී යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ, ඉන්දීය රජයේ ධීවර, පශු පාලන සහ කිරි නිෂ්පාදන සහ තොරතුරු සහ විකාශන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය එල්. මුරුගන්, ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ, ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක සහ ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍ය කාදර් මස්තාන් යන මහත්වරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම විවිධ ක්ෂේත්‍රවල සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් 2023 පෙබරවාරි 11 වන දින ජනතා අයිතියට පත් කෙරිණ.

2. යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් තිළිණයක් බව සඳහන් කළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ සම්බන්ධයෙන් එතුමාට සහ ඉන්දීය රජයට කෘතවේදීත්වය පළ කළේය. ආර්ථික අභියෝගයන් හිදි ශ්‍රී ලංකාවට ලබා දුන් සහයෝගය වෙනුවෙන් ද ජනාධිපතිතුමා ඉන්දියාවට සිය ස්තුතිය පළ කළේය. දෙරට අතර සංස්කෘතික සමානතා අවධාරණය කරමින් එතුමා ප්‍රකාශ කළේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව එකම කාසියේ දෙපැත්ත වන බවයි.

3. මෙම අවස්ථාව අමතමින් රාජ්‍ය අමාත්‍ය ආචාර්ය එල්. මුරුගන් මැතිතුමා ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සහයෝගීතාවය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය මත පදනම් වන බව සඳහන් කළේය. එතුමා යාපනය විශ්ව විද්‍යාලයේ ආර්ථික දුෂ්කරතා

ඇති පවුල්වල සිසුන් 100 දෙනෙකු සඳහා විශේෂ ශිෂ්‍යත්ව වැඩසටහනක් ද නිවේදනය කළේය. ඉන්දියානු රජය උතුරු පළාත පුරා ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කර තිබෙන බව ද එතුමා පෙන්වා දුන්නේය.

4. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය වෙනුවෙන් විශේෂ සමරු තිළිණයක් රාජ්‍ය අමාත්‍ය ආචාර්ය එල්. මුරුගන් මැතිතුමා වෙත පිරිනැමීය. මෙම උත්සවයේ දී ඉදිරිපත් කරන ලද සංස්කෘතිකාංග ශ්‍රී ලංකා සංස්කෘතියේ පොහොසත්බව සහ විවිධත්වය ප්‍රදර්ශනය කළේය.

5. අති නවීන මෙම සංස්කෘතික මධ්‍යස්ථානය තට්ටු දෙකක කෞතුකාගාරයක්, ආසන 600කට අධික ප්‍රමාණයකින් යුත් නෘත්‍යශාලා ආකාරයේ නවීන ශ්‍රවණාගාරයක්, තට්ටු 11ක ඉගැනුම් කුළුණක්, එළිමහන් රංග ශාලාවක් ලෙස ද භාවිතා කළ හැකි මහජන චතුරස්‍රයක්, වායු සමනය කරන ලද ප්‍රදර්ශන ගැලරි, විවෘත ප්‍රදර්ශන සහ ආසන 100කින් සමන්විත සම්මන්ත්‍රණ ශාලාවක් ඇතුළු විවිධ පහසුකම්වලින් සමන්විත වේ.

6. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2015 මැයි මාසයේ දී යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා මුල්ගල තැබූ අතර එය ඉන්දියානු අග්‍රාමාත්‍යවරයකු යාපනයේ සිදුකළ පළමු සංචාරය වේ. යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමෙන් අනතුරුව එය 2022 මාර්තු මාසයේදී විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර අතථ්‍ය ආකාරයෙන් විවෘත කරන ලදී.

7. යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය උතුරු පළාත ඇතුළු ශ්‍රී ලංකාවේ ජනතාවට ඉන්දියානු රජයේ කැපවීම පිළිඹිබු කරන මාහැඟි නිදසුනකි. ශ්‍රී ලංකාව සමඟ ඉන්දියානු රජයේ සංවර්ධන සහයෝගීතාවය ඇමරිකානු ඩොලර් බිලියන 5 ක් වන අතර එමගින් යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස, ජීවනෝපාය සංවර්ධනය වැනි දෛනික ජීවිතයේ සෑම පැතිකඩක්ම ස්පර්ෂ කරයි.

***

කොළඹ
2023 පෙබරවාරි 11